රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 2000 ස්ථලය**
**පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්**

**PAL 21523/ PAL21623 - අනිර්දිෂ්ට ග්‍රන්ථ ගද්‍ය රචනය හා ත්‍රිපිටක සාහිත්‍ය ඉතිහාසය**

01,02,03 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

1. සිංහලට නගන්න.

ඉමෙහි ඛො අයං දෙව කුමාරො ද්වත්තිංසමහාපුරිසලක්ඛණෙහි සමන්නාගතො යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස ද්වෙව ගතියො භවන්ති අනඤ්ඤා, සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්සිමානි සත්තරතනානි භවන්ති: සෙය්‍යථිදං– චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිණායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති. සචෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති, අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවත්තච්ඡදො''ති.

අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා නෙමිත්තෙ බ්‍රාහ්මණෙ අහතෙහි වත්ථෙහි අච්ඡාදාපෙත්වා සබ්බකාමෙහි සන්තප්පෙසි. අථ ඛො භික්ඛවෙ බන්ධුමා රාජා විපස්සිස්ස කුමාරස්ස ධාතියො උපට්ඨාපෙසි. අඤ්ඤා සුදං පායෙන්ති. අඤ්ඤා නහාපෙන්ති. අඤ්ඤා ධාරෙන්ති. අඤ්ඤා අඞ්කෙන පරිහරන්ති. ජාතස්ස ඛො පන භික්ඛවෙ විපස්සිස්ස කුමාරස්ස සෙතච්ඡත්තං ධාරියිත්ථ දිවා චෙව රත්තිඤ්ච 'මා නං සීතං වා උණ්හං වා තිණං වා රජො වා උස්සාවො වා බාධයිත්ථා'ති. ජාතො ඛො පන භික්ඛවෙ විපස්සී කුමාරො බහුනො ජනස්ස පියො අහොසි මනාපො. සෙය්‍යථාපි භික්ඛවෙ උප්පලං වා පදුමං වා පුණ්ඩරීකං වා බහුනො ජනස්ස පියං මනාපං, එවමෙව ඛො භික්ඛවෙ විපස්සී කුමාරො බහුනො ජනස්ස පියො අහොසි මනාපො. ස්වාස්සුදං අඞ්කෙනෙව අඞ්කං පරිහරීයති.

(ලකුණු 12)

2. සිංහලට නගන්න.

උන්නමෙ උදකං වට්ටං යථා නින්නං පවත්තති,
එවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති.

යථා වාරිවහා පූරා පරිපූරෙන්ති සාගරං,
එවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති.

අදාසි මෙ අකාසි මෙ ඤාතිමිත්තා සඛා ච මෙ,
පෙතානං දක්ඛිණං දජ්ජා පුබ්බෙ කතමනුස්සරං.

න හි රුණ්ණං ව සොකො වා යා චඤ්ඤා පරිදෙවනා,
න තං පෙතානමත්ථාය එවං තිට්ඨන්ති ඤාතයො.

අයඤ්ච ඛො දක්ඛිණා දින්නා සඞ්ඝම්හි සුප්පතිට්ඨිතා,
දීඝරත්තං හිතායස්ස ඨානසො උපකප්පති.

(ලකුණු 12)

3. පාලියට නගන්න.

කසී (රටේ) එක් ගමෙකැ එක්තරා කුල ගෙයක් පසු පසෙහි රුදුරු කිඹුලුන් ගහන ගඟෙක් වෙයි. ඒ කුලගෙයි එක ම පුතෙක් විය. පියා කළුරිය කළ කල්හි තෙමේම මව පිළිදූගී. නො කැමැතිවැ සිටි (යැදී) ඔහුට මව කුල දුවක් ගෙනාවාය. මුල දී ඕ නැන්දණියන් සතුටු කළා, පසු වැ දූ පුතුන් ගෙන් වැඩෙන්නී ඇය බැහැර කරනු කැමැති වූවාය. ඇය ගේ මව ද ඒ ගෙහි ම වසයි.

ඇය හිමියා හමුවෙහි නැන්දණියන් ගේ නො එක් විදියේ දෙස් කියා බිඳුවා ''මට ඔබ ගේ මව රකිනු නො හැකිය. ඇය මරවයි'' කියා ''මිනී මැරීම නම් බැරෑරුම් (කටයුත්තකි) කෙසේ ඇය මරම් දැ'' යි කී කල්හි ''නින්දට වන් කල්හි ඇඳත් සමග ම ඇය කිඹුලුන් ඇති ගඟට දමමු. කිඹුල්ලු ඇය මරා දමති'' යි කීවාය. ''තිගේ මව කොයිබද?'' ''ඇය සමීපයෙහි ම නිදයි.'' එසේ නම් යව, ඇය නිදන ඇඳේ රැහැනක් බැඳ සංඥාවක් කරව (යි කීය) ඇය එසේ කොට ''ම විසින් සංඥා කරන ලද'' යි කීවාය. ''මිනිසුන් නිදන තුරු මඳක් ඉවසව'' යි අනෙකා නිදන්නාක් මෙන් මඳක් වැතිරී හිඳ ගොස් ඒ ලණුව බිරිය ගේ මව ගේ ඇඳේ බැඳ, බිරිය පුබුදුවා දෙදෙනාම ඇය ඇඳත් සමග ඔසොවා ගෙන ගොස් ගඟෙහි දැමූහ. එහි කිඹුල්ලු ඇය මරා කා දැම්මෝ'ය.

(ලකුණු 16)

4. විනය පිටකයෙහි අන්තර්ගතය හා ආකෘතිය පිළිබඳ අවධානය යොමුකරමින් විනය පිටකයට හැඳින්වීමක් සපයන්න.

(ලකුණු 10)

5. දේශක, ශ්‍රාවක, අන්තර්ගතය යන කරුණුවලට ප්‍රමුඛතාව ලබාදෙමින් දීඝනිකායේ ශ්‍රාවකභාෂිත සූත්‍ර පිළිබඳ විමසීමක් කරන්න.

(ලකුණු 10)

6. පරවාද මථනයෙහි ලා මජ්ඣිමනිකායෙහි සුවිශේෂ නැඹුරුතාව සනිදර්ශන ව පහදන්න.

(ලකුණු 10)

7. ඛුද්දකනිකාය පිළිබඳ ව පවත්නා විවිධ මතවාද විමර්ශනය කරන්න.

(ලකුණු 10)

8. "අභිධර්මය බුද්ධභාෂිතයකි." පක්ෂ ව හෝ විපක්ෂ ව කරුණු දක්වන්න.

(ලකුණු 10)

@@@@@@@@@@@@@@@@@@@@@@@@@



70